ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | මානව සම්පත් දෙපාර්තමේන්තුව |
| දිනය | **2015 ඔක්තෝබර් 09** |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක ස්ථාන මාරු කිරීම්

මෑතදී සිදු කරන ලද මහ බැංකු සේවක ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් මාධ්‍ය වාර්තා කිහිපයක් මහ බැංකුවේ අවධානයට ලක් විය. එහෙයින් මේ සම්බන්ධ යථා තත්ත්වය පැහැදිලි කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් කරයි.

මෙම මධ්‍ය වාර්ෂික ස්ථාන මාරු කිරීම් වසර කිහිපයක සිට වාර්ෂිකව සිදු කෙරෙන නිත්‍ය වැඩපිළිවෙලකි. ස්ථාන මාරුවීමක් මගින් සේවකයකු හට විවිධ ක්ෂේත්‍ර හරහා පැතිරුණු මහ බැංකු ක්‍රියාකාරකම් පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සැලසෙයි. ඒ අනුව, පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළුව විවිධ ආකාරයේ දේශීය සහ විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමට අමතරව, සේවකයන්ගේ රාජකාරි කටයුතු මාරු කිරීම මගින් සේවකයන්ට මහ බැංකු කටයුතු පිළිබඳව වඩා පුළුල් පරාසයක අත්දැකීම් ලබා ගැනීමට හැකි වේ.

තවද, බැංකුව විසින් සේවකයන්ගේ වෘත්තීය ප්‍රගමනය සඵලදායී කිරීමත් සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරු කරා උසස් කිරීම සඳහා අවශ්‍ය සේවා අවශ්‍යතාවන් ගෙන් පරිපූර්ණ වන අයුරින් කාර්යය මණ්ඩලය සූදානම් කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන මෙම මාරු කිරීම් සිදු කර ඇත.

එසේම, සේවා අවශ්‍යතාවයන්ට අනුකූලව සේවකයන් බැංකුවෙහි ඕනෑම දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය කාර්යාලයක සේවයෙහි යෙදවීමේ අධිකාරී බලය ද ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.